ලක්ෂ්මන් කදීර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ ගනුදෙනු පිළිබඳ වාර්තාව- 2024

ලක්ෂ්මන් කදීර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කිරීම

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් මාර්ගෝපදේශයෙහි 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2023 හා 2024 වර්ෂවලට අදාළ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.4 2022 දෙසැම්බර් 31 දිනට පැවති වත්කම් හා වගකීම්වල තත්ත්වය

ආයතනය විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2022 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන අයිතමය	වටිනාකම
	රු.

<u>වත්කම්</u>	
ජංගම නොවන වත්කම්	163,361,209
ජංගම වත්කම්	4,299,622

මුළු වත්කම්	**167,660,831**
	========
<u>ස්කන්ධය හා වගකීම්</u>	
ස්කන්ධය	165,680,033
වගකීම්	1,980,798

මුළු බැරකම්	**167,660,831**
	=========
මුළු ආදායම	47,564,977
මුළු වියදම	44,664,904

අතිරික්තය	**2,900,073**
	=========

2. විගණන නිරීක්ෂණ

2.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	**අනුකූල නොවීම**	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ) 2006 අංක 32 දරන උපායමාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන (සංශෝධන) පනත (i)10(අ) වගන්තිය	ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පුද්ගලයින් පස්දෙනෙකුගෙන් සමන්විත ජාත්‍යන්තර උපදේශක සභාවක් පත්කළ යුතු වුවත් එවැනි උපදේශක සභාවක් පත්කර නොතිබුණි.	ක්ෂේත්‍ර 5 ක් ආවරණය වන අයුරින් පුද්ගලයින් 5 දෙනෙකුගෙන් යුත් ජාත්‍යන්තර උපදේශක සභාව පත් කිරීම සඳහා යෝජනා කරමින් 2023 නොවැම්බර් 17 වන දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් කළමනාකරණ රැස්වීමට ඉදිරිපත් කර ඇත.	පනත ප්‍රකාරව ජාත්‍යන්තර උපදේශක සභාවක් පත් කිරීමට කටයුතු කළ යුතුය.
(ii)10 ඉ(1) හා ඉ(2) වගන්ති	පනත ක්‍රියාත්මක වන 2006 සැප්තැම්බර් 29	බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය,	පනතේ විධිවිධාන ප්‍රකාරව පුහුණු

	දින සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය, මෙම ආයතනය වෙත පවරා ගතයුතු අතර එය ආයතනයේ ඒකකයක් වශයෙන් පුහුණු වැඩසටහන් හා වෙනත් අධ්‍යයන පාඨමාලා පැවැත්විය යුතුය. තවද එහි සේවයේ නියුක්තව සිටි නිලධාරීන් හා සේවකයින්ද, ආයතනයේ නිලධාරීන් හා සේවකයින් ලෙස සැලකිය යුතුය. එසේ වුවත්, ආයතනය හා සේවකයන් පවරා ගෙන නොතිබුණි.	අධ්‍යයන ආයතනයේ ඒකකයක් වශයෙන් පවරා ගැනීම නොසලකා හැරීමට හේතු විය හැක්කේ ආයතනයට 2006 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කිසිදු ප්‍රතිපාදනයක් රජයෙන් ලබා නොදීම විය හැක. ආයතනයේ කුලිය ගෙවීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට විදේශ කටයුතු අමාත්‍යාංශය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන 2023 වර්ෂයේ පෙබරවාරි මස සිට කුලිය ගෙවීම සඳහා ප්‍රතිපාදන දෙනු ලබයි.	ආයතනය හා එහි කාර්යය මණ්ඩලය මෙම ආයතනයට පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)10ඉ(2)(i) වගන්තිය	පනත ක්‍රියාත්මක වන දිනයට පෙර බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය විසින් පවත්වාගෙන යන යම් ගිණුමක බැරට තිබූ සියලු මුදල් ආයතනයේ අරමුදලට මාරු කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි.	බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය විසින් පවත්වාගෙන යන ගිණුම් වල ඇති මුදල් ආයතනය ස්වඋත්සහයෙන් උපයාගත් බැවින් හා සේවක වැටුප්, ප්‍රාග්ධන වියදම් හා අනෙකුත් පුනරාවර්තන වියදම් ගෙවීමට රජයෙන් ප්‍රතිපාදන නොලැබෙන බැවින් එම මුදල් ගිණුමට මාරු කිරීමට හැකියාවක් නොමැත.	පනතේ විධිවිධාන අනුව පුහුණු ආයතනයේ බැංකු ගිණුමේ පවතින ශේෂය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
(i)මුදල් රෙගුලාසි 395(ඌ)	බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනයේ බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම, එකතුවන මුදල් බැංකුවේ තැන්පත් කිරීම, චෙක්පත් ලිවීම හා මුදල් පොත පවත්වා ගැනීම යන සියලු කාර්යයන් එකම නිලධාරිනියක් විසින්	මෙම ආයතනයේ සිදුවන සියලුම වැඩ කටයුතු සිදු කිරීමට ඇත්තේ නිළධාරීන් තිදෙනෙකු බැවින් එලෙස කාර්යයන් බෙදා කිරීම ප්‍රායෝගිකව අපහසු කාර්යක් වී ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව මුදල් කාර්යයන් විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය.

		සිදුකර තිබුණි.		
	(ii)මුදල් රෙගුලාසි 756(6)	සෑම වර්ෂයකම මාර්තු 31 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2024 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.	භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කරනු ලබන්නේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් වන අතර භාණ්ඩ සමීක්ෂණය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ.	මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය සිදු කර වාර්තා ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ (II) ඡේදය	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව ආයතනවලට කාර්යමණ්ඩල බඳවා ගැනීම් හා ගෙවනු ලබන වැටුප් හා දීමනා තීරණය කිරීමෙන් වැළකිය යුතු වුවත්, ඊට පටහැනිව විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය වෙත අනුයුක්ත කළ නිලධාරීන් 04 දෙනෙකු සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය වෙත අනුයුක්ත කළ නිලධාරීන් 02 දෙනෙකු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත එකතුව රු.820,711 ක දීමනා සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් අනුයුක්ත කරන ලද නිලධාරීන් සඳහා මාසිකව මූලික වැටුපෙන් 1/3 ක දීමනාවක් ගෙවා ඇති බව පිළිගනිමි. මෙම තීරණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ අතර මේ සම්බන්ධව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබා ගැනීම සඳහා සටහන් කර ගතිමි.	කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය රහිතව දීමනා නොගෙවිය යුතුය.
(ඈ)	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	(i)සේවකයන් සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මඟින් සනාථ කිරීමට කටයුතු කර නොතිබුණි.	මිල ගණන් කැඳවා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිලදී ගැනීමට සටහන් කර ගතිමි.	සේවක පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මඟින් සනාථ කළ යුතුය.
		(ii)අතිකාල දීමනා ගෙවීමේදී පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් සනාථ	ආයතනය තුළ නිරතුරුවම පැවැත්වෙන සම්මන්ත්‍රණ, සාකච්ඡා හා වෙනත් විශේෂ	පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මඟින් සනාථ

	කරගත යුතු වුවද ඒ අනුව කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප් ලෙස රු.750,918 ක් නිලධාරීන් 03 දෙනෙකුට ගෙවා තිබුණි.	අවස්ථා සඳහා කටයුතු සූදානම් කිරීමේ සියළු කටයුතු දැනට කරනු ලබන්නේ නිලධාරීන් 05 දෙනෙකු මඟින් වන බැවින්, අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප් ගෙවීම් සිදු කරන ලදි .	කරගැනීමෙන් පසුව අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප් ගෙවිය යුතුය.
(ඉ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දෙන ලද රජයට අයත් ව්‍යවසායන් සඳහා වූ මෙහෙයුම් අත්පොතේ			
(i) 3.2.(i) වගන්තිය	කාර්යය මණ්ඩලය බඳවා ගැනීමේ පටිපාටි සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවත් ආයතනයේ පුහුණු අංශය වන බණ්ඩාරණායක ජාත්‍යන්තර පුහුණු අංශයේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ පටිපාටිය හා වැටුප් පරිමාණ සඳහා ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.	නව කාර්යය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2024 අප්‍රේල් 17 වන දින ලැබී ඇත. 2025 මැයි 26 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මේ පිළිබඳව පත්‍රිකාවක් යොමු කර ඇති අතර බඳවා ගැනීමේ පටිපාටිය හා වැටුප් පරිමාණ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව බඳවා ගැනීමේ පටිපාටි සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය.
(ii) 6.6 වගන්තිය	වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසන්වී මාස පහක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් ආයතනය 2007 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.	2023 වාර්ෂික වාර්තාව නව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. 2024 වාර්ෂික වාර්තාවේ මෙහෙයුම් හා ව්‍යාපෘති කටයුතු මේ වන විට අවසන් කර ඇත.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය.

(ඊ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දෙන ලද රජයට අයත් ව්‍යවසායන් සඳහා වූ යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 වගන්තිය	එක් එක් ක්‍රියාකාරකම් සඳහා නිශ්චිත කාල රාමු, මූල්‍ය ඇස්තමේන්තු හා ඒ සඳහා වගකිව යුතු පුද්ගලයන් දක්වමින් ආයතනය තම අරමුණු ඉටුකරගැනීම සඳහා ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.	2026 වර්ෂයේ සිට දක්වා ඇති පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ආකෘතිය අනුව සකස් කිරීමට සටහන් කර ගතිමි.	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව නිවැරදි ආකෘතිය අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය.
(උ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය	වර්ෂය තුළ සිදු කිරීමට අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු හා එහි පිරිවැය ඇතුළත් කරමින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතු වුවත් ආයතනය විසින් එසේ කටයුතු කර නොතිබුණි.	2024 ජනවාරි 11 වන දිනෙන් පසු ආයතයේ අධ්‍යක්ෂක මණ්ඩලය රැස් නොවූ බැවින් 2024 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලසුමක් අනුමත වී නොමැත. ඉදිරියේදී 2025 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලසුමක් සකස් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.	මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 අප්‍රේල් 17 දිනැති අංක ඩීඑම්එස්/1828 දරන කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් ආයතනය සඳහා අනුමත කාර්ය මණ්ඩලය හා ඊට අදාළ වැටුප් පරිමාණයන් ඉදිරිපත්කර තිබුණ ද ඒ අනුව කාර්යය මණ්ඩලය වෙත වැටුප් ගෙවීමට අවශ්‍ය කටයුතු ඉටු කර නොතිබුණි.	නව කාර්යය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2024 අප්‍රේල් 17 වන දින ලැබී ඇතත් අලුතින් ඇති කරන ලද තනතුරු සඳහා බඳවාගැනීමේ පටිපාටිය මෙතෙක් අනුමත නොවීම හේතුවෙන් බඳවා ගැනීමට නොහැකි විය. ආයතනයේ ඉතිරි සේවක මණ්ඩලය කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් වන බැවින් නව වැටුප් පරිමාණයන්ට අනුව වැටුප් ගෙවීමේ හැකියාවක් නැත. 2024 ජනවාරි මාසයෙන් පසු ක්‍රියාකාරී අධ්‍යක්ෂ මණ්ඩලයක් නොපැවති අතර 2025 මැයි 26 වන දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මේ පිළිබඳව යොමු කර ඇත.	අලුතින් ඇති කරන ලද තනතුරු සඳහා බඳවාගැනීමේ පටිපාටි අනුමතකර ගැනිමට හා අනුමත වැටුප් පරිමාණයන් අනුව වැටුප් ගෙවීමට කටයුතු කළ යුතුය.